# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 7 ශ්‍රේණිය

## කතෝලික ධර්මය　　　　කාලය :පැය 2

## 1 කොටස

**<u>සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුර තෝරා යටින්ඉරක් අදින්න.</u>**

1. එලීෂා දිවැසිවරයා කළ ප්‍රාතිහාරයයකි,
   (1) යාගය මතින් ගිනි එවීම　　(2) නාමන්ගේ කුෂ්ඨ රෝගය සුව කිරීම
   (3) කොර වූ පුද්ගලයෙකු සුව කිරීම　　(4) නියඟයේදී වර්ෂාව ලබා දීම

2. " දෙවියන් වහන්සේ ශක්තිමත් කරන සේක" මෙම අර්ථය සහිත නාමය හිමි දිවැසිවරයා වන්නේ,
   (1) ජෙරමියා දිවැසිවරයා　(2) යෙසායා දිවැසිවරයා　(3) එලියා දිවැසිවරයා　(4) එසකියෙල් දිවැසිවරයා

3. ආබ්‍රහම් තුමන්ගේ ජීවිතයේ අප දකින ප්‍රබලතම ආදර්ශය වන්නේ,
   (1) දෙවියන් වහන්සේ කෙරෙහි ස්ථිර විශ්වාසය තැබීම
   (2) අභියෝග හමුවේ පසුබැසීම
   (3) තම දරුවාට නීති රීති දමා හදා වඩා ගැනීම
   (4) දෙවියන් වහන්සේගේ වචනය සොයා බැලීම

4. ප්‍රසාද ස්නාපනය මාර්ගයෙන් අප ඇතුලත් වෙන්නේ,
   (1) සාමූහික ජීවිතයකට　　(2) ගිවිසුම් ජීවිතයකට
   (3) සාර්ථක ජීවිතයකට　　(4) සාමාන්‍ය ජීවිතයකට

5. ජාකොබ් තුමාට "ඊශ්‍රායෙල්" යන නාමය ලැබුන බව කියවෙන දර්ශනය සිදු වූයේ,
   (1) බෙතෙල්හි දීය.　　(2) දේව මාළිගයේ දීය
   (3) තාබෝර් කන්ද මතදීය　　(4) පෙනුයෙල් හි දීය

6. A - ජේසුස් වහන්සේගේ වචනයට කීකරු වීම　　B - තම දේපළ අන් අයට පැවරීම
   C - ජීවිතයේ මුල් තැන ජේසුස් වහන්සේට දීම　　D - වෙළඳාමෙන් ලැබෙන මුදල් පරිත්‍යාග කිරීම

ඉහත කරුණු අතරින් " මා අනුව එන්න " යන වගන්තිය පවසමින් ජේසුස් වහන්සේ තෝරාගත් ප්‍රථම ශ්‍රාවකයන් තුළ වන ගුණාංග සහිත කරුණු ඇතුළත් පිළිතුර වන්නේ
   (1) A හා D ය　(2) A හා C ය　(3) B හා C ය　(4) B හා D ය

7. මුල් කිතුනු සභාවේ දෙළොස්වන අපෝස්තුලුවරයා වන්නේ
   (1) ජුදාස් ය　(2) ජාකොබ් ය.　(3) පාවුලු ය　(4) මතියස් ය

8. ක්‍රිස්තුන් වහන්සේව ලොවට හඳුන්වා දීම සඳහා කළ හැකි දෙයක් වන්නේ,
   (1) ශුද්ධ බයිබලය පෙනෙන ස්ථානක තැබීම　　(2) මිනිසුන්ට පෙනෙන ලෙස යාච්ඤා කිරීම
   (3) මීසමේ සමිති සමාගම්වලට බැඳී සේවය කිරීම　(4) අන් ආගම්වල වැරදි පෙන්වා දීම

9. පූජාප්‍රසාදිතුමන්ලාගේ මංගල්‍යය ලෙස සැලකෙන්නේ කවදාද?
   (1) මහ බ්‍රහස්පතින්දා　　(2) මහා සිකුරාදා
   (3) ආලේලූයියා සෙනසුරාදා　　(4) පාස්කු ඉරිදා

10. පූජකවරයේ ධූරයන් තුන අඩංගු නිවැරදි පිළිතුර වන්නේ,
   (1) පදවි පූජක, පැවිදි පූජක, තේවාවාරී　　(2) තේවාවාරී , පූජාප්‍රසාදී , රාජගුරුප්‍රසාදී
   (3) පදවි පූජක, තේවාවාරී, පූජාප්‍රසාදී　　(4) පූජාප්‍රසාදී , රාජගුරුප්‍රසාදී , කාදිනල්

11. කිතුනු විවාහයේ ලක්ෂණයකි,
(1) කීකරුකම (2) ආත්මාර්ථකාමිත්වය (3) දිළිඳුකම (4) අඛණ්ඩභාවය

12. හතරවන දේව පනතට අනුව දෙමව්පියන්ට මෙන්ම අප විසින් ගරු කළ යුතු තවත් පිරිසක් නොවන්නේ,
(1) ගුරුවරුන් (2) අපව වැරදි මග ගෙනයන්නන්
(3) වැඩිහිටියන් (4) ආගමික නායකයින්

13. අට වන දේව පනතට අනුව අප විසින් කළ යුතු ක්‍රියාව වන්නේ,
(1) පිරිසිදු චරිතයකින් සිටීම (2) දෙමාපියන්ට සැලකීම
(3) අන් අයගේ වස්තුව සුරැකීම (4) සත්‍යයට සාක්ෂි දැරීම

14. බොරු කීම නිසා හදිසි මරණයට ගොදුරු වූ දෙදෙනෙකි,
(1) පේදුරු හා ජොහන් (2) අදම් හා ඒව
(3) අනනියස් හා සපීරා (4) කායින් හා ආබෙල්

15. ජේසුස් වහන්සේ විසින් අපෝස්තුලුවරුන්ට ධර්මදූත කාර්යයේ වගකීම් පැවරුවේ,
(1) ස්වර්ගාරෝහණය වීමට පෙරය (2) මහ බ්‍රහස්පතින්දා ය
(3) පෙන්තකොස්ත දින දී ය (4) කල්වාරියේ කුරුසිය මතදීය

16. ප්‍රසාද ස්නාපනයේ දී අත්‍යාවශ්‍ය හා අනිවාර්ය සංකේතය කුමක්ද?
(1) සුදු වස්ත්‍රය පැළඳීම (2) ශුද්ධ වූ තෛලයෙන් ආලේප කිරීම
(3) හිසට ජලය වත්කිරීම (4) ඉටි පහන් දැල්වීම

17. " පැවිදි ජීවිතය ගත කරන සැම දෙනාම ............................ගොඩ නැගීමේ කාර්යයට සහය දක්වයි." මෙහි හිස් තැනට සුදුසු වචනය වන්නේ,
(1) මුල් කිතුනු සභාව (2) මීසම් සභාව
(3) දේව රාජ්‍යය (4) අපෝස්තලික සභාව

18. ආශීර්වාදකාර බන්ධනය දේව ප්‍රසාද නිධානය ස්ථාපිත කළේ ,
(1) කානා නුවර විවාහයේ දය (2) ලෝක ආරම්භයේදී ය
(3) ආබ්‍රහම්ගේ හා සාරාගේ විවාහයේදීය (4) නව ගිවිසුම ආරම්භයේ දීය

19. පොදු පූජකවරය මගින් අපට පැවරෙන කාර්යයන් වන්නේ,
(1) දිවැසි, පූජක , එඬේරික (2) පූජක , තේවාචාරී, දිවැසි
(3) රාජකීය , එඬේරික, පූජක (4) පූජක, දිවැසි , රාජගුරු

20. රේගු පොළේදී " මා අනුව එන්න" යන ජේසුස් වහන්සේගේ ඇරයුම පිළිගෙන උන්වහන්සේ පසුපස ගියේ
(1) පේදුරු ය (2) මතෙව් ය (3) පුවාම් ය (4) පිලිප් ය

(ලකුණු 2X20=40)

# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

**දෙවන වාර පරීක්ෂණය - 2023**

**7 ශ්‍රේණිය**

**කතෝලික ධර්මය**

**2 කොටස**

**පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න**

1/ (1) ජේසුස් වහන්සේගේ අපෝස්තුලුවරුන් 4 දෙනෙකු නම් කරන්න
(2) ක්‍රිස්තුන් වහන්සේව ලොවට හඳුන්වා දීමට ඔබට කළ හැකි දේවල් 2 ක් ලියන්න
(3) "ඔබ කිතුනු ශ්‍රාවකයෙකි" එබැවින් ඔබට පාසල තුළ කළ හැකි කාර්යයන් 4 ක් ලියන්න
(4) ක්‍රිස්තු අනුගාමී ඔබ උන්වහන්සේට වඩාත් සමීප වීමට කළ හැකි ක්‍රියාවන් 4 ක් ලියන්න
(5) ක්‍රිස්තුන් වහන්සේගේ ආදර්ශය අනුව ජීවත් වීමට පිහිට ඉල්ලා කෙටි යැදුමක් ලියන්න
(ලකුණු 4X5=20)

2/ (1) ඔබ කතෝලිකයෙකු බවට පත්වීම සඳහා ලැබූ ප්‍රසාද නිධානය කුමක්ද?
(2) ආරම්භක දේව ප්‍රසාද නිධාන තුන නම් කරන්න.
(3) ප්‍රසාද ස්නාපනය ලැබූ ඔබ සැබෑ කිතුනු දරුවෙකු ලෙස කළ හැකි කාර්යයන් 5 ක් ලියන්න.
(ලකුණු 2+3+5 =10)

3/ (1) පූජකවරුන් බෙදෙන ප්‍රධාන කොටස් 2 නම් කරන්න
(2) පූජාප්‍රසාදීන් වහන්සේලා වෙනුවෙන් ඔබ විසින් ඉටු කළ හැකි යුතුකම් 3 ක් ලියන්න
(3) පූජාප්‍රසාදීන්වහන්සේලා වෙනුවෙන් කිව හැකි යාච්ඤාවක් නිර්මාණය කරන්න
(ලකුණු 2+3+5 =10)

4/ (1) පූජක නොවන පැවිදි අය බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න
(2) පැවිදි නිකායන් 3 ක් නම් කරන්න
(3) පැවිදි අයගේ සේවාවන්ට ඔබට සහයෝගය දැක්විය හැකි ආකාර 5ක් ලියන්න
(ලකුණු 2+3+5 =10)

5/ (1) පොදු පූජකවරයේ වගකීම් ඉටු කිරීමට සම්බන්ධ විය හැකි සමිති සමාගම් 2 ක් නම් කරන්න
(2) එම එක් සමිතියකින් කෙරෙන කාර්යයන් 3 ක් ලියා දක්වන්න
(3) දේවස්ථානය තුළ ගරුත්වය ආරක්ෂා කර ගැනීමට ඔබට කළ හැකි ක්‍රියාවන් 5 ක් ලියන්න
(ලකුණු 2+3+5 =10)

5/ (1) කිතුනු විවාහයේ ලක්ෂණ 2 ක් ලියන්න
(2) දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටු විය යුතු යුතුකම් 3 ක් ලියන්න
(3) " ශුද්ධ වූ පවුල අප කිතුනු පවුලට ආදර්ශයකි" මෙම වගන්තියට අනුව කිතුනු පවුලක දරුවකු ලෙස ඔබ කටයුතු කරන ආකාර 5 ක් ලියන්න
(ලකුණු 2+3+5 =10)

6/ (1) දස පනතේ දෙවන කොටසට අයත් පනත් දෙකක් ලියන්න .
(2) පාසල වෙනුවෙන් ඔබට ඉටුකළ හැකි යුතුකම් 3 ක් ලියන්න
(3) රට වෙනුවෙන් ඔබට ඉටු කළ හැකි යුතුකම් 5 ක් ලියන්න
(ලකුණු 2+3+5 =10)